Australian Government

Inspector-General of Taxation

Taxation Ombudsman

# බදු සම්බන්ධ පැමිණිලි



Sinhalese

# අප කවුරුන්ද?

ඉන්ස්පෙක්ටර් ජෙනරාල්වරයා සහ බදු සම්බන්ධ ඔම්බඩ්ස්මන්වරයා (The Inspector-General & Taxation Ombudsman (IGTO) යනු ඕස්ට්‍රේලියානු බදු කාර්යාලය (Australian Taxation Office (ATO)) සහ බදු වෘත්තීකයන්ගේ මණ්ඩලය (Tax Practitioners Board (TPB)) මගින් ගනු ලබන පරිපාලන ක්‍රියා සම්බන්ධයෙන් ඔබට ඇති පැමිණිලි සම්බන්ධයෙන් ඔබ හට උපකාර කිරීමේ වගකීම ඇති ෆෙඩරල් රජයේ ස්වාධීන ආයතනයකි.



1300 44 88 29 (දේශීය ඇමතුම් මිලට)

# අප විසින් උපකාර කල හැකි ආකාරය

ඔබගේ පැමිණිලි සම්බන්ධයෙන් සලකා බැලීමට අප විසින් ස්වාධීන බදු විශේෂඥ සේවාවක් නොමිළේ ලබාදේ.

'පරිපාලන ක්‍රියා' යනු ATO හෝ TPB ඔබ සමඟ කටයුතු කරන අතරතුර සාධාරණ සහ යුක්තිසහගත ආකාරයට කටයුතු කරන්නේද යන්න සඳහාවූ පුළුල් අර්ථ නිරූපණයකි.

IGTO විසින් ඔබට උපකාර කල හැකි උදාහරණ අතර පහත දේ ඇතුලත් වන අතර මේවාට පමණක් සීමා නොවේ:

- ඔබගේ ඉල්ලීම්වලට කලට වේලාවට ප්‍රතිචාර දැක්වීම;
- ATO සහ TPB නිලධාරීන්ගේ ක්‍රියා කලාපය;
- මාර්ගගත සේවා තිබීම;
- ATO සහ TPB මගින් ගනු ලබන ක්‍රියාකලාපයන් සම්බන්ධ තහවුරුව හෝ ලබාදෙන පැහැදිලි කිරීම්වල ප්‍රමාණවත්බව;

www.igt.gov.au

- ATO සහ TPB ගනු ලබන ක්‍රියා කලාපයන් ඔවුන්ගේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් හා ගැලපෙන බව; සහ
- ATO සහ TPB මගින් ඔබ සමග සාධාරණ සහ විනිවිද පෙනෙන ආකාරයට කටයුතු කරන බව සහ විගණන සහ විමර්ශන ඇතුළුව සියළුම කරුණු සැලකිල්ලට ගන්නා බව තහවුරු කිරීම.

අප විසින් ඔබට උපකාර කල හැකිද යන්න සැකයක් ඇතිනම්, කරුණාකර අප හා සම්බන්ධ වන්න.

අප හට ඔබට කෙලින්ම උපකාර කල නොහැකි නම්, ඔබ හට උපකාර කිරීමට ඉතාම යෝග්‍ය ආයතනය සම්බන්ධයෙන් අපි ඔබට උපදෙස් ලබාදෙමු.

GPO Box 551, Sydney NSW 2001

# පැමිණිලි ක්‍රියාවලිය

අපගේ කාර්යාලය වෙත පැමිණිල්ලක් යොමු කිරීම සඳහා “අප හා සම්බන්ධවන ආකාරය” (How to contact us) කොටස බලන්න.

ඔබ විසින් පැමිණිල්ලක් ඉදිරිපත්කල පසු, විමර්ශන නිලධාරියෙකු විසින් වැඩකරන දින 2ක් ඇතුලත ඔබ හා සම්බන්ධවී පැමිණිල්ල ලැබුණු බව පිළිගෙන ඔබගේ පැමිණිල්ල ඔබ සමග සාකච්ඡා කරනු ඇත.

හැකිනම් ඔබගේ පැමිණිල්ල සම්බන්ධයෙන් කටයුතුකර අපි ඔබට උපකාර කිරීමට කටයුතු කරමු.

ඔබගේ පැමිණිල්ල සම්බන්ධයෙන් හොඳින් අවබෝධකර ගැනීම සඳහා සහ ඔබට හොඳින්ම උපකාර කල හැකි ආකාරය සම්බන්ධ තීරණය කිරීම සඳහා ඔබගෙන්, ATO හෝ TPB වෙතින් අප හට වැඩිදුර විස්තර ලබා ගැනීමට අවශ්‍ය විය හැකිය.

අපගේ ප්‍රගතිය සම්බන්ධයෙන් අප ඔබව දැනුවත්ව තබන අතර ක්‍රියාවලිය පුරා අපගේ විමර්ශනයේ කාලවකවානු සම්බන්ධයෙන් ඔබව දැනුවත් කරනු ඇත.

# අප හා සම්බන්ධවන ආකාරය

**www.igt.gov.au**

**1300 44 88 29**
(දේශීය ඇමතුම් මිලට)

**GPO Box 551**
**Sydney NSW 2001**

ඔබට ඉංග්‍රීසි භාෂාව හැර වෙනත් භාෂාවකින් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට අවශ්‍යනම්, දුරකථන අංක **131 450** ඔස්සේ පරිවර්තන සහ තෝල්ක සේවාව (Translating and Interpreting Service (TIS)) අමතන්න.

ඔබ හට ඇසීමේ හෝ කථා කිරීමේ ආබාධයක් ඇති අතර නිසි ටෙලිටයිප්රයිටරයකට (TTY) හෝ මෝඩම් උපකරණයකට ප්‍රවේශය ඇතිනම්, කරුණාකර දුරකථන අංක **13 36 77** අමතන්න.

ඔබ හට TTY උපකරණයකට හෝ මෝඩම් උපකරණයකට ප්‍රවේශය නැතිනම්, දුරකථන අංක **1300 555 727** ඔස්සේ ස්පීච් ටු ස්පීච් රිලේ සේවාව (Speech to Speech Relay Service) අමතන්න.